# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය-2015
## Primary Piriven Year End Term Test - 2015
### 4 වසර / Grade 4

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**සිංහල**
**SINHALA**

කාලය : පැය 03 යි.
Time : Three hours.

I කොටසේ ප්‍රශ්න දෙකටද, II කොටසින් එක් ප්‍රශ්නයක්ද, III කොටසින් ප්‍රශ්න දෙකක්ද තෝරා ගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

## I කොටස

(01) (අ) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු වාක්‍ය රචනයක් ලියන්න.

i. ජල සම්පත රැක ගැනීමට කටයුතු කරමු.
ii. පළිබෝධ නාශක භාවිතය රටට අහිතකර වේ.
iii. හෙළ සිරිත් වැඩි දියුණු කරන සිංහල හින්දු අලුත් අවුරුද්ද.
iv. ඉවසීමෙන් සැනසීම ලැබේ.
v. මත් වතුර, මත් ද්‍රව්‍ය රට දැය වනසයි.

(ලකුණු 25)

(ආ) පහත සඳහන් ඡේදය 1/3 ක් වන සේ සාරාංශ කරන්න.

18 සහ 19 වැනි ශත වර්ෂයන්හි සිදු වූ ඇතැම් විපර්යාස සාහිත්‍ය කෙරෙහි බලපෑ බව ද එය අලුත් මුහුණුවරකින් සකස් කිරීමෙහි ලා උපකාරී වූ බව ද වර්තමාන සාහිත්‍ය දෙස විචාරාක්ෂියෙන් බලන විට පෙනී යයි. යාන්ත්‍රික යුගයට සරිලන පරිදි සමාජය හැඩ ගැසීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් එහි අලුත් පන්තියක් පැන නැංගේය. එනම් නාගරික මැද පන්තිය යි. වර්තමාන ලේඛකයන් බොහෝ සෙයින් බිහි වූයේ අලුතෙන් උද්ගත වූ මැද පන්තියෙන්ය. අතීතයෙහි සිට වැඩි වශයෙන් පැවිදි කතුවරුන්ට භාරව තිබූ ලේඛන කලාව ක්‍රමයෙන් ඔවුන්ගේ අතින් ගිලිහී ගිහි ලේඛකයන්ගේ අතට පැමිණෙන්නට පටන් ගති. මේ වූ කලී සාහිත්‍ය ලෝකයෙහි එක්තරා විප්ලවයක් ඇති කිරීමෙහි ලා සමර්ථ වූ සිදුවීමකි.

(ලකුණු 10)

(02) (අ) පහත සඳහන් ගද්‍ය පද්‍ය කොටස් කියවා එහි අදහස් ලිහිල් බසින් ලියන්න.

ඒ නායක උන්නාන්සේ විසිනුදු ඒ ශිෂ්‍ය සමාගමත් එකතු කර ගෙන ඒ විහාර ස්ථානයත් දියුණුපට්ටු කිරීමෙන් සංඝරාජෝත්තම සාමිදරුවන් වැඩ ඉන්න තුරා සුවච කීකරු ලෙසින් දවසැර ඒ සංඝරාජ සාමිදරුවෝ ආශ්චර්‍ය අද්භූත වශයෙන් පුරලෝක ප්‍රාප්ත වූ කල්හි උදාර වශයෙන් පවත්වන ආදාහන කෘත්‍ය මතක දාන පූජාවටත් එකතුව බොහෝ දේ සොඳින්ම පිරිමසමින් පෝයමළු විහාරෙ ඒ සාමී දරු නමින් පැවත එන සැම උන්නාන්සේලා කෙරෙහි ඇඳහිලි සමගි සතුටු බැව් ඇතිව සොඳින් ම කල් යවනවාය. (ලකුණු 10)

(ආ) පන් සිළු වීණා නද පසු බැස්වූ
මන් පිනවන වෙණ නදයෙන් තොස්වූ
නන් දනකැන් දුටුවද බිය සිස්වූ
මින් රළවුත් ගං වෙරළට රැස්වූ

වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් සියපත් විදමිනි
පුර' ඔර වසමින් සිටි රඟ කුම් වැනි
සුර සෙනඟට සුරසුන් පැනවූ වැනි

(ලකුණු 10)

## II කොටස.

(03) (අ) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන තෝරන්න.

i. පශ්චාද් / පිපිසද්ඝා / පුණ්‍යාදාර.
ii. වජ්‍රාසන / මධ්‍යස්ත / මර්දණය.
iii. විද්‍යුත් / විදග්ද / විරුඬ.
iv. පීටය / ව්‍යංගයාර්ථ / ව්‍යාදිය.
v. ව්‍යාඝ්‍ර /ව්‍යාර්ත / වෛෂ්‍ය

(ලකුණු 05)

(ආ) පහත ඉරි ඇඳි පදවල සමාස නම් කරන්න.

i. උපාසකයා පන්සිල් ගත්තේ ය.
ii. හිරු නැගෙනහිර දිසාවෙන් එබී බලයි.
iii. සොරු මුතුමැණික් රැගෙන ගියහ.
iv. දූදනා කළගුණ නොසලකයි.
v. රජතුමා සියලු සතුරුබිය තුරන් කළේය.

(ලකුණු 05)

(ඇ) පහත සඳහන් සන්ධි පද විසන්ධි කරන්න.

i. හේතූදාහරණ. ii. පිළිතුරු. iii. ගංවතුර. iv. රත්මලාන. v. වැල්ලම්පිටිය.

(ලකුණු 05)

(04) (අ) පහත සඳහන් අර්ථ දීමට තද්ධිත නාම ලියන්න.

i. කෘශ බොහෝ ඇති. ii. ගලින් නිමවන ලද. iii. රිදීයෙන්ම කළ
iv. ධනය බොහෝ ඇති. v. ගරු කටයුතු මව.

(ලකුණු 05)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. අයියා පාසල් ගියේ ය.
ii. ගොවියෝ කුඹුරු කොටති.
iii. ඇදුරුතුමා අවවාද දුන්නේ ය.
iv. තොටියා ඔරුව පැද ගියේ ය.
v. අපි නවකතා පොත් කියවමු. (ලකුණු 05)

(ඇ) පහත දැක්වෙන වාක්‍ය සුදුසු විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

i. කම්කරුවෝ වෙහෙසවී වැඩ කළහ
ii. වෛරයෙන් වෛරය නොසංසිඳේ යනු බුද්ධ වචනයෙකි
iii. දරුව මා කියන ලෙස කටයුතු කරව
iv. මේ බව නොදන්නෝ කවුරු ද
v. ගුණදාස කුඩා කල සිටම දක්ෂ ළමයෙකි

(ලකුණු 05)

(05) (අ) පූර්ව ක්‍රියාවක් , මිශ්‍ර ක්‍රියාවක් , ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් , විධි ක්‍රියාවක් , ආශීර්වාද ක්‍රියාවක් යොදා වාක්‍ය එක බැගින් නිර්මාණය කරන්න. අදාළ ක්‍රියාව යටින් ඉරක් අඳින්න.

(ලකුණු 05)

(ආ) පහත සඳහන් ඡේදය නිවැරදි ලෙස පද බෙදා ලියන්න.

වේදසතරසහඑ්වේදයන්ආශ්‍රයෙන්ඇතිවූබ්‍රාහ්මණආරණ්‍යකසහඋපනිෂද්යනග්‍රන්ථසමුදාය වෛදිකසාහිත්‍යයයිහැඳින්වේඑහෙත්අපමෙපරිච්ඡේදයෙන්විවේචනයකිරීමටබලාපොරොත් තුවනසතරවේදයපමණක්හැඳින්වීමපිණිසමෙහිදීවේදසාහිත්‍යයයන්නව්‍යවහාරකරනුලැබේ.

(ලකුණු 05)

(ඇ)

| | |
|---|---|
| තොටිල්ල සැම සුව | පිරි |
| පැද්දෙයි තාලෙට | සරි |
| අසමින් ගී | සුමිහිරි |
| නිදන්න පුත | රන් කිරි |

මෙහි ඇතුළත් ඒකවචන ක්‍රියා පදයක් , මිශ්‍ර ක්‍රියාවක් , නාම පදයක් , උපසර්ග පදයක් , විධි ක්‍රියාවක් උපුටා දක්වන්න.

(ලකුණු 05)

## III කොටස.

(06) තම රජතුමාට අවංකව සේවය කරන සේනා නායකයෙකු ලෙස නායක සෙනවි හඳුනාගත හැක. විජයබා කොල්ලයෙන් නිදසුන් ගෙන මේ බව සනාථ කරන්න.

(ලකුණු 15)

(07) ගුත්තිල ඇදුරුතුමාගේ වීණා වැයීමේ හැකියාව නිසා සත්තු ද මත් වී සිටිති.

නිදසුන් මගින් මෙය සත්‍ය දැයි පෙන්නුම් කරන්න.

(ලකුණු 15)

(08) පිරිහී තිබුණ ශාසනික ප්‍රතිපත්ති නගාසිටුවීමට සංඝරාජ හිමි දරන ලද උත්සාහය කොතෙක් දැයි නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)